# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා විසින්
2020 සැප්තැම්බර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2020 සැප්තැම්බර් මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[2 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2020 ජනවාරි මස 1 වන දින සිට ආර්ථික සේවා ගාස්තුව ඉවත් කිරීම වේ.

එල්.ඩී.–ඕ. 62/2019

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2020 අංක    දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "සෑම තැනැත්තකුගෙන් ම සහ සෑම හවුල් ව්‍යාපාරයකින් ම අවස්ථාවෝචිත පරිදි," යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව ම සෑම තැනැත්තකුගෙන් ම සහ සෑම හවුල් ව්‍යාපාරයකින් ම අවස්ථාවෝචිත පරිදි," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.